**04-06-2022 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබ කාමදේනුව (සියලු ආශා ඉටු කරන ගවයා) ගේ, එනම්, ජගදම්බාගේ පුතනුවරුන් සහ දියණිවරුන්ය. ඔබ සියලු දෙනාගේ ආශාවන් ඉටු කර, ඔබගේ සහෝදර සහෝදරියන්ට සත්‍ය මාවත පෙන්විය යුතුයි.

**ප්‍රශ්නය:** පියා විසින් ඔය දරුවන්ට ලබා දී ඇති වගකීම කුමක්ද?

**පිළිතුර:** දරුවනි, අසීමිත පියා පැමිණ ඇත්තේ අසීමිත සතුට ලබා දීමටයි, එබැවින් ඔබගේ වගකීම වන්නේ මෙම පණිවුඩය සෑම කෙනෙකුටම ලබා දීමය. පියාගේ උදව්කරුවන් වී, සෑම නිවසක්ම දිව්‍යලෝකයක් කරන්න. කටු, මල් බවට පරිවර්ථනය කිරීමේ සේවය කරන්න. පියා මෙන් නිරහංකාර සහ අශරීරික වී, සෑම කෙනෙකුටම උපකාර කරන්න. ඔය දරුවන්ගේ විශාලතම වගකීම වන්නේ, මුළු ලෝකයම සතුරා වන රාවනගේ උල් නිය වලින් නිදහස් කර ගැනීමයි.

**ගීතය:** මව්නි, අහෝ මව්නි, සැමගේ භාග්‍යය සාදන්නා ඔබයි.

ඕම් ශාන්ති. මවගේ ප්‍රශංසාව ගායනා කරන්නේ භාරතයේ පමණයි. ජගදම්බා, සැබැවින්ම භාග්‍යය සාදන්නාය, එබැවින් ඇයට කාමදේනු, එනම්, සියලු ආශා ඉටු කරන්නී, යන නම ලබා දී ඇත. ඇයට මෙම උරුමය ලැබෙන්නේ කාගෙන්ද? ජගදම්බා සහ ජගත්පිතා යන දෙදෙනාටම මෙම උරුමය ලැබෙන්නේ ශිව බාබාගෙන්ය. ඔබ ජීවාත්මයක්, යන විශ්වාසය ඔය දරුවන්ට තිබේ. ජීවාත්මයක් දැකිය නොහැකි නමුත් වටහාගත හැක. ජීවාත්මය සහ මනුෂ්‍යයා ඇත. ජීවාත්මය අවිනාශී වන නමුත් මෙම දෑසින් පෙනෙන සිරුර, විනාශ වෙයි. ජීවාත්මයක දර්ශනයක් ලබා ගත හැක. විවේකානන්දට (ශ්‍රේෂ්ඨ ජීවයක්) ජීවාත්මයක දර්ශනයක් ලැබුණු බව කියයි. කෙසේවෙතත්, ඔහුට එය වටහාගැනීමට නුපුළුවන් විය. ඔබගේ ජීවාත්මයේ දර්ශනයක් ඔබට ලැබෙන්නේ නම්, එය ඔබගේ පියාගේ දර්ශනයක් ලැබෙනවා හා සමාන බව, ඔය දරුවන්ට වැටහෙයි. ජීවාත්මයක් කෙබඳුද, ජීවාත්මයන්ගේ පියාද එබඳුය: එහි වෙනසක් නැත. බුද්ධියෙන් මෙය වටහාගත හැක: මේ පියා වන අතර මොවුන් දරුවන්ය. සියලු ජීවාත්ම, සිහිපත් කරන්නේ එම පියාවයි. මේ දෑසින් තමන්ගේම ජීවාත්මය හෝ පියාව දැක ගැනීම සිදුවිය නොහැක්කක්. ඔහු දෙවියන්, උත්තරීතර කෙනා, පරමාත්ම ජීවය, පරම දනව්වේ නිවැසියාය. භක්ති මාර්ගයේ ඔවුන් දැඩි භක්තියේ යෙදෙන විට, ඔවුන්ට දර්ශන ලැබෙයි. ඒ මොහොතේ එම ජීවාත්මය එම සිරුර තුළට පැමිණියා නොවෙයි. නැහැ, එම ජීවාත්මය ගොස් වෙනත් උපතක් ගත්තා. භක්ති මාර්ගයේ, මිනිසුන් කුමන හැඟීමකින් කාට වැන්දත්, ඔවුන්ට එම කෙනාගේ දර්ශනයක් ලැබෙයි. ඔවුන් ගණන් කළ නොහැකි තරම් ප්‍රතිමා සාදා ඇත. එයට බෝනික්කන් වන්දනා කිරීම යැයි කියයි. ඒවා ගැන විශ්වාසය තිබීමෙන්, ඔවුන්ට තාවකාලික සතුටේ සුළු තිළිණයක් ලැබෙයි. ඔබගේ එය අසීමිත සතුටේ අසහාය කාරණාවකි. ඔබ දිව්‍යලෝකයේ ප්‍රතිලාභය හිමි කරගන්නා බව ඔබ දන්නවා. භක්තියේ යෙදීමෙන් කිසි කෙනෙකුට දිව්‍යලෝකයට යාමට නොහැක. භක්ති මාර්ගය අවසන් වූ විට, එනම්, ලෝකය පැරණි වූ විට, කලි යුගයට පසුව පමණයි, ස්වර්ණමය යුගය, නව ලෝකය පැමිණෙන්නේ. මෙය කිසි කෙනෙකුගේ බුද්ධියේ සනිටුහන් වන්නේ නැහැ. සන්‍යාසීන් පවසන්නේ: අහවල් කෙනා ආලෝකයට මුසු වුණා, නමුත් එසේ වන්නේ නැත. ඔබට දැන් ශ්‍රීමත් ලෙස හැඳින්වෙන, දේවමය නුවණ ලැබී තිබේ. වචන ඉතා හොඳයි. ශ්‍රී ශ්‍රී දෙවියන් පවසයි. අපව දිව්‍යලෝකයේ අධිපතියන් බවට පත් කරන කෙනා ඔහුයි, එනම්, ඔහු අපව සාමාන්‍ය මනුෂ්‍යයන්ගෙන් නාරායන බවට පරිවර්ථනය කරයි. ශ්‍රීමත් අනුගමනය කිරීමෙන් අපි ලෝක රාජධානිය හිමි කරගන්නවා. ශ්‍රී ශ්‍රී 108 මාලාව බොහෝ ප්‍රශංසාවට ලක් වී ඇත. මැණික් 8ටේ මාලාවද තිබේ. සන්‍යාසීන් එම මාලාවද භාවිත කරමින් මතුරයි. ඔවුන් 'ගව මුඛය' ලෙසින් හැඳින්වෙන රෙදි මල්ලක් සාදා එය තුළට ඔවුන්ගේ අත දමා, මාලාවක පබුළු බ්‍රමණය කරයි. බාබා පැවසුවේ : නිරන්තරයෙන් මා සිහි කරන්න, නමුත් එහි අරුත ලෙස ඔවුන් සැලකුවේ මාලාවක පබුළු බ්‍රමණය කිරීම යන්නය. පාරලෞකික පියා දැන් පැමිණ, බ්‍රහ්මාගේ මාර්ගයෙන් ඔබව ඔහු සතුකරගෙන ඇති බව, ඔය දරුවන් දන්නවා. ප්‍රජාපිතා (ප්‍රජාවගේ පියා) මෙන්ම ප්‍රජාමාතාව (ප්‍රජාවගේ මව) ද සිටිනවා. ජගදම්බා ප්‍රජාවගේ මව ලෙස හැඳින්වෙන අතර ලක්ෂ්මි, ලෝකයේ අධිරාජිනිය ලෙස හැඳින්වෙයි. ඔබ ලෝක මාතාව කියුවත්, ජගදම්බා කියුවත් එය එකමයි. ඔබ දරුවන්ය, එබැවින් මෙය පවුලකි. ඔය දරුවන්ද සියල්ලන්ගේම ආශාවන් ඉටු කරන අයයි. ඔබ

ජගදම්බාගේ දියණියන් සහ පුතනුවන්ය. ඔබගේ සහෝදර සහෝදරියන්ට ඔබ මාර්ගය පෙන්වන බවට කුල්මත්භාවය, ඔබගේ බුද්ධියේ තිබේ. එය ඉතා පහසුයි. භක්ති මාර්ගයේ බොහෝ අපහසුතා තිබේ. හත යෝගාව සහ ප්‍රානයාම (ශ්වසන ව්‍යායාම) කරන බොහෝ දෙනෙක් සිටියි. ඔවුන් ස්නානය කිරීමට ගංගාවලට යයි. ඔවුන් බොහෝ වෙහෙස වෙයි. පියා දැන් පවසන්නේ : ඔබ වෙහෙසට පත්ව ඇත. විස්තර කර දෙනු ලබන්නේ, අශාරීරික පරම පියා, පරමාත්ම ජීවය සමග, ඔවුන්ගේ සම්බන්ධතාවය කුමක්ද කියා වටහාගන්නා, බ්‍රහ්මනයන්ට පමණයි. ‘ශිව බාබා’ යන වචන සුදුසුයි. ඔබ ‘රුද්‍ර බාබා’ යැයි නොකියයි, ඔබ පවසන්නේ ‘ශිව බාබා’ කියා පමණයි. මෙය ඉතා පහසුයි. තව අසංඛ්‍යෙය නම් තිබෙන නමුත් නිවැරදි නම වන්නේ ශිව බාබාය. ශිවා යනු තිතකි: රුද්‍රා යනු තිතක් නොවෙයි. ඔවුන් ‘ශිව බාබා’ යැයි කියන නමුත් ඔවුන්ට කිසි දෙයක් වැටහෙන්නේ නැත. ශිව බාබා සහ ඔය සැලිග්‍රමයන් සිටිනවා. ඔය දරුවන්ට දැන් ඔබගේ හිස මත වගකීමක් තිබේ. ගාන්ධි සිතා සිටියේ, භාරතය විදේශිකයන්ගෙන් නිදහස් කරගත යුතු බවයි. එය සීමිත කාරණයකි. පියා දැන් ඔය දරුවන්ට වගකීමක් භාරදෙනවා. විශේෂයෙන් භාරතයත්, සාමාන්‍යයෙන් ලෝකයත්, මායා රාවන යන සතුරාගෙන් නිදහස් කළ යුතුයි. එම සතුරා ලෝකයට බොහෝ දුක ගෙන දී ඇත, එබැවින් ඔබ ඔහුව පරාජය කළ යුතුයි. ගාන්ධි, සියලුම විදේශිකයන්ව භාරතයෙන් පිටමං කළා. රාවනද මහා විදේශිකයෙකි. තඹ යුගයෙදී රාවන බලහත්කාරයෙන් ඇතුල් වන අතර, කිසිවෙකුට ඒ ගැන අවධානයක් නැත. රාවන පැමිණ මුළු රාජධානියම පැහැර ගනී. භාරතය බොහෝ සෙයින් බංකොලොත් කර ඇති පැරණිතම විදේශිකයා ඔහුය. ඔහුගේ උපදෙස් පිළිපැදීමෙන් භාරතය බොහෝ සේ දූෂිත වී ඇත. මෙම සතුරා මෙහි සිට පිටමං කළ යුතුයි. ඔහුව පිටමං කරන්නේ කෙසේද යන්න, ඔබට ශ්‍රීමත් ලැබෙනවා. ඔබ පියාගේ උදව්කරුවන් විය යුතුයි. ඔබ මට අයත් වන නමුත් ඉන්පසුව අන් අයගේ උපදෙස් පිළිපදින්නේ නම්, ඔබ ඇද වැටෙයි. ඔබට උසස් තත්ත්වයක් හිමි කරගැනීමට නොහැකි වෙයි. මෙසේ ගායනා කරයි: දරුවන්ට එඩිතරකම තිබේ නම්, පියා උපකාර කරයි. ඔබ දෙවියන්ගේ උදව්කරුවන්ය. කුදා (දෙවියන්) පැමිණ ඔබට උපකාර කරයි. ඔවුන් එම කෙනා සිහිපත් කර මෙසේ කියයි: අහෝ පාරිශුද්ධකරු වඩිනු මැනව! උපකාර කරන අයට සේවකයන් යැයි කියයි. බාබා බොහෝ සේ නිරහංකාරී! ඔහු අශාරීරිකයි. ඔහු ඔබට නිරහංකාර සහ පාපයෙන් තොර වන අන්දම උගන්වයි. ඔබ අන් අයව ඔබට සමාන කළ යුතුයි, එනම් කටු, මල් බවට පරිවර්ථනය කළ යුතුයි. ඔබ පාපයේ නොගැලෙන බවට සහතික වෙයි. පැරණිතම සතුරා එයයි. එය ජය ගත යුතුයි. සමහරු මෙසේ ලියයි: බාබා, අපි පරාජය වුණා, තවත් සමහරු බාබාට පවා නොකියයි. ඔවුන් තමාගේ නමට මෙන්ම සත්ගුරුගේ නමට අපහාස ගෙනෙන අතර තමන්ටම පාඩු සිදුකර ගනී. ඔබ ශිව බාබාගේ මුණුපුරන් සහ මිණිපිරියන් බවත් ප්‍රජාපිතා බ්‍රහ්මාගේ දරුවන් බවත් ඔය දරුවන් දන්නවා. බ්‍රහ්මා, ශිව බාබාගෙන් උරුමය හිමි කරගන්නා අතර ඔය දරුවන්ද එය හිමි කරගන්නේ ඔහුගෙනි. චක්‍රයකට පෙරද ඔබ බාබාගෙන් උරුමය හිමිකර ගත් බව ඔය දරුවන් දන්නවා. වැටහෙන්නේ ජීවාත්මයටයි. එක් සිරුරක් හලා දමා තව එකක් ගන්නේ ජීවාත්මයයි. නමක් ලබා දෙන්නේ සිරුරටයි. ශිව බාබා, ඔබට දැනුම දීම සඳහා පමණක් ණයට සිරුරක් ගනී. බ්‍රහ්මාගේ මුඛය තුළින් ශිව දෙවියන් කතා කරයි. ජීවාත්මයක් සිරුරක් අත් හල විට එයට සිදුවන්නේ කුමක්ද හෝ ඔහු පැමිණෙන්නේ කෙසේද ආදි වශයෙන් විස්තර කීමට අවශ්‍ය නැත. එම කාරණා තුළට යාමෙන් ඵලක් නැත. එය දර්ශනයක් පමණයි. සිදුවන කුමක් වුවත් දර්ශනයක් පමණයි. සූක්ෂම දේශයට මාර්ගය දැන් විවෘතයි. බොහෝ දෙනෙක් පැමිණ පිටව යයි. එහි දැනුම හෝ යෝගාව පිළිබඳ ප්‍රශ්නයක් නැත. ඔවුන් බෝග් පුදන අතර ජීවාත්මය පැමිණි විට, එයට ආහාර කවා, පානයක් ලබා දෙයි. ඒ සියල්ල කතාබස් පමණයි. ඔය දරුවන් කෙරෙහි බාබා තුළ බොහෝ සෙනෙහස තිබේ. ඔය දරුවන් පවසන්නේ: බාප්දාදා අප ඔබ වෙතට පැමිණ සිටියි. ශිවා සහ ප්‍රජාපිතා බ්‍රහ්මා සිටියි. ආදිතම මුතුන් මිත්තා යැයි කියන්නේ බ්‍රහ්මාට පමණයි. පාරම්පරික වෘක්ෂය ඉතා විශාලයි. ඔබට මෙම කෙනාට ශිව බාබා යැයි ඇමතිය නොහැක. මෙය මනුෂ්‍යයන්ගේ පාරම්පරික වෘක්ෂයයි: එය ශාරීරික ලෝකය පිළිබඳ කාරණයකි. සියලුම පරම්පරා වලින් මෙම පළමුවැන්න ප්‍රධාන එක ලෙස හැඳින්වෙයි. මෙය විශාල නාට්‍යයක්. ඔය දරුවන්ට දැන් නිවැරදිව වැටහෙන නමුත් නොවැටහෙන සමහරෙක්ද සිටියි. අඩු තරමින්, ශිව බාබා සෑම කෙනෙකුගේම පියා බවවත් ඔවුන් වටහා ගත යුතුයි. උරුමය ලැබෙන්නට යන්නේ සීයාගෙන්ය. මෙම කෙනාටද එය ලැබෙන්නේ ඔහුගෙනි. අච්චා, බ්‍රහ්මාව අමතක කරන්න: විවාහ ගිවිස ගැනීමෙන් පසුව සිදුවන්නේ කුමක්ද? එවිට කපුවාව සිහි කරන්නේ නැත. මෙම කෙනා කපුවාය: ඔහු ඔබගේ විවාහ ගිවිස ගැනීම සිදුකරයි. බාබා පවසන්නේ : අහෝ දරුවනේ. ඔහු කතා කරන්නේ ජීවාත්මයන්ටයි. ඔහුව සිහි කරන්නේ ජීවාත්මයි: බාබා පැමිණ අපව පිවිතුරු කරන්න. බාබා පවසන්නේ : මා සිහි කරන්න, එවිට ඔබ නොකඩවා පිවිතුරු වෙයි: වෙනත් ක්‍රමයක් නැත. එවිට නිහඬ දේශයේ සිට මා ඔබව දිව්‍යලෝකයට යවන්නම්. මෙය දෙමාපියන්ගේ නිවසයි. එය, නැන්ද-මාමලාගේ

නිවසයි. දෙමාපියන්ගේ නිවසෙදි ආභරණ පැළඳීම නීතිය නොවෙයි, නමුත් මෙකල එය මෝස්තරය වී ඇත. ඔබ ඔබගේ නැන්ද-මාමලෑ නිවසට ගිය විට, ඔබ සියලු දේ පළඳින බව, ඔබ මෙකල දන්නවා. විවාහයට පෙර කුමාරියගෙන් සෑම දෙයක්ම ඉවත් කරයි: ඇය අඳින්නේ පරණ ඇඳුම්ය. බාබා ඔබව සරසන්නේ ඔබව ඔබගේ නැන්ද-මාමලාගේ නිවසට යැවීම සඳහා බව ඔබ දන්නවා. උපත් 21කට සදාකාලිකව ඔබ නැන්දා-මාමලාගේ නිවසේ සිටිව්. කෙසේවෙතත්, ඒ සඳහා ඔබ නියත වශයෙන්ම උත්සාහ දැරිය යුතුයි, ඔබ පිවිතුරු විය යුතුයි. ඔබගේ ගෘහයේ වාසය කරන අතර, ඔබ නෙළුම් මලක් මෙන් පිවිතුරු විය යුතුයි. මේ ඔබගේ අවසන් උපතයි. පියා විස්තර කරන්නේ : පෙර එය අමිශ්‍ර සතෝප්‍රධාන් වන්දනාව වූ අතර එය දැන් තමෝප්‍රධාන් වී ඇත. බොම්බායේ ඔවුන් ගණදෙවියන්ව වන්දනා කරන අතර ඒ වෙනුවෙන් රුපියල් සිය දහස් ගණනක් වියදම් කරයි. ඔවුන් දේවතා ප්‍රතිමා නිර්මාණය කර, ඒවා රැක බලාගෙන ඉන්පසුව ජලයේ ගිල්වා දමයි: ඔවුන් ඒවා විනාශ කර දමයි. ඔය දරුවන් දැන් ඒ සෑම දෙයක්ම විශ්මයක් බව සලකන නමුත් එම චාරිත්‍ර වාරිත්‍ර කුමක්ද කියා ඔබට විස්තර කළ හැක. ඔවුන් දේවතාවියකට උපතක් ලබා දී එයට වන්දනාමාන කර, ආහාර කවා, උත්සව පවත්වා ඉන්පසුව එය ජලයේ ගිල්වා දමයි. එය පුදුමයක්! ඔවුන් තුල්සි (පූජනීය ඖෂධීය පැළයක්) සහ ක්‍රිෂ්ණාගේ විවාහය පෙන්වයි. ඔවුන් මංගල උත්සවය මහත් උත්සවාකාරයෙන් සමරයි. විදේශිකයන් එවන් කතා ඇසූ විට, ඇතැම් විට එය එසේ සිදු වන්නට ඇති බව ඔවුන් සිතනවා. ඔවුන් බොහෝ කතා ගොතා තිබේ. මෙහි, එය සූදුවක් පිළිබඳ ප්‍රශ්නයක් නොවන නමුත්, පාණ්ඩවයන් සූදු කෙලියෙහි යෙදී, ද්‍රෞපදීව ඔට්ටු ඇල්ලූ බව ඔවුන් කියයි. ඔවුන් බොහෝ කතා ලියා ඇත. ඒ සියල්ල තුළින් රාජයෝගාව පිළිබඳ කාරණාව සම්පූර්ණයෙන්ම නැතිව ගොස් ඇත. පියා දැන් පවසන්නේ : මා සිහිපත් කරන්න! එය ඉතා පහසුයි. ඔබ උපත් 21කට දිව්‍යලෝකයට එනම්, ක්ෂීර සාගරයට යන බව ඔබගේ බුද්ධියට ඇතුළු විය යුතුයි. මෙය විෂ සාගරයයි. ඔබ විෂ සාගරයෙන් ඉවතට පැමිණ, ක්ෂීර සාගරයට යනවා. ඔබගේ කාරණා අළුත්ය. මෙය අසන ජනතාව පුදුමයට පත් වෙයි. ඔබ දිව්‍යලෝකයේ සැබවින්ම බොහෝ සතුටින් සිටින බව ඔය දරුවන්ට වැටහෙයි. ඔබ දිව්‍යලෝකයේ පාලකයන් බවට පත් වනවා. කිසිම කෙනෙකුට අපගේ රාජධානිය උදුරා ගත නොහැක. මෙකල බොහෝ බෙදීම් තිබේ: ඔවුන් දිගටම ගැටෙයි. ඔය දරුවන් මෙසේ විස්තර කළ යුතුයි: ඔබගේ සැබෑ සතුරා රාවනයි. චක්‍රයෙන් චක්‍රයට ඔබ ඔහු පරාජය කරයි. මායා පරාජය කරන්නන්, ලෝකය ජයගන්නන් වන්නේ ඔබලාය. මෙය ජය පරාජයේ ක්‍රීඩාවයි. ඔබ නියත වශයෙන්ම ජයගන්නා බව ඔබ දන්නවා: ඔබට පරාජය විය නොහැක. විනාශය අත ළඟය. ලේ ගංගා ගලයි. බොහෝ දෙනෙක් හේතුවක් නොමැතිව මිය යයි. මෙයට අපාය යැයි කියයි, එනම්, දූෂිත අපවිත්‍ර ලෝකයයි. සෑම කෙනෙක්ම ගයන්නේ: අහෝ පාරිශුද්ධකරු, වඩිනු මැනව! පියා පවසන්නේ : ඔය ජීව, තාරකා වන සේම මාද තරුවකි. නාටකයේ බන්දනයෙන්, මාද බැඳී සිටිනවා. කිසි කෙනෙකුට ඉන් නිදහස් විය නොහැක. මෙම පැරණි ලෝකයට පැමිණීමට මට තිබුණු අවශ්‍යතාවය කුමක්ද! මා උත්තරීතර දනව්වේ නිවැසියාය. මෙම නාටකයේ සෑම කෙනෙක්ම තම තමන්ගේ චරිත කොටස් රඟපායි. සිත කනස්සල්ලට පත් කිරීමේ ප්‍රශ්නයක් නැත. මෙහි ඔබ කුල්මත්භාවයෙන් සිටීමෙන් සැහැල්ලුවෙන් සිටියි. ඔබ ඉතා වාම්ය. පියා ඔබට කරදර නොකරයි. සිහිපත් කිරීමේ සිට අන් අයටද බාබා සිහි කිරීමට මග පාදන්න, එපමණයි. අසීමිත පියා, අසීමිත සතුට ලබා දීමට පැමිණ සිටියි. ඔබ මෙම ආරාධනාව සෑම නිවසකටම ලබා දිය යුතුයි. ඔබ මෙපමණක් කළ යුතුයි. ඔය දරුවන්ට විශාල වගකීමක් තිබේ. මායා දෙස ටිකක් බලන්න: ඇය සම්පූර්ණයෙන් මුළු සත්‍යයම විනාශ කර දමයි. භාරතය බොහෝ දුකට පත් වී තිබේ. මායා ඔබට දුක් ගෙන දුන්නා. ඔය දරුවන් දැන් පියාට උදව් කර, කටු මල් බවට පරිවර්ථනය කළ යුතුයි. ඔබගේ බ්‍රහ්මන වංශයේ සිටින්නේ කුමන මල්ද කියා ඔබ දන්නවා. ඔබ සේවය කරන්නේ නම්, ඔබට තත්ත්වයක් හිමි වෙයි. එසේ නැතහොත් ඔබ පුරවැසියන්ගෙන් කොටසක් වෙයි. මෙහි උත්සාහයක් තිබේ. සේවයේ නියැලී සිටින බොහෝ දරුවන් සිටියි. බොහෝ දියණියන්ට මෙහි පැමිණීමට අවසර නොලැබෙයි: ඔවුන් බොහෝ පහර කෑමට ලක්වෙයි. මේ සඳහා එඩිතරකම අවශ්‍යයි. ඔබ තුළ බියක් නොතිබිය යුතුයි: ඔබ නිර්භීත විය යුතුයි. ඒ සමගම ඔබ සියලු බැඳීම් වලින්ද නිදහස් විය යුතුයි. බැඳීම්ද අඩු නැත: එය ඉතා බලවත්ය. කෙනෙක් ධනවත් පවුලකින් නම්, බාබා ප්‍රථමයෙන් ඇගේ ශරීර අවධානය බිඳ දමන්නේ ඇයට අතුගෑමට හෝ භාජන සේදීමට කීමෙන්ය. බාබා ඔවුන්ට පරීක්ෂණ ලබා දෙයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ශ්‍රීමත් වලට අනුව ඔබ පියාගේ සැබෑ උදව්කරුවන් විය යුතුයි. තමන්ගේම මනසේ හෝ අන් අයගේ මනසේ උපදෙස් පිළිනොපදින්න. බැඳීම් වලින් නිදහස් වී, නිර්භීත වී, තමන්ව සේවයේ යොදවන්න.
2. වර්තමානයේ අප සිටින්නේ දෙමාපියන්ගේ නිවසේ බැවින් අපට මෙහිදි කිසිම ආකාරයක මෝස්තර අනුගමනය කළ නොහැක. දැනුමේ මිණිමුතු වලින් තමන්ව සරසගන්න. පිවිතුරුව රැඳී සිටින්න.

**වරදානය:** ඔබ ශෝකය සතුටට සහ නින්දාව ප්‍රශංසාවට පරිවර්ථනය කරන පින්වත් ජීවාත්මයක් වේවා. පින්වත් ජීවාත්මයක් වූ කලී කිසිවෙකුටත් දුක දීම හෝ කිසිවෙකුගෙන් දුක ගැනීම කිසිසේත් නොකරන කෙනෙකි. ඒ වෙනුවට, ඔහු දුක සතුටේ හැඩයෙන් ගන්නා අතර නින්දාව ප්‍රශංසාව ලෙස සලකයි. එම කෙනා පින්වත් ජීවාත්මයක් කියා ඔබට තේරුම් ගත හැකි වේ. ඔබට නින්දා කරන දුක දෙන ජීවාත්මයෙක් ව ඔබේ කරුණාබරිත ස්වරූපයෙන්, කරුණාවන්ත දැක්මෙන් දැකීමේ පාඩම ස්ථිර කරගන්න. විවේචනාත්මක දැක්මෙන් නොවේ. එම කෙනා ඔබට අපහාස කරන්නට ඇති. එහෙත් සරළව ඔහුට මල් පුදන්න. එවිට ඔබව පින්වත් ජීවාත්මයක් යැයි අමතනු ලැබේ.

**පාඨය:** බප්දාදාව තම දෑසේ ගිල්වා ගත්තන් ලොවේ ආලෝක සහ ලොවේ දෑස් වෙති.

***** ඕම් ශාන්ති *****